## සති පාසල කාර්ය පත්‍රිකාව

**01 පන්තිය -** 11 ශ්‍රේණිය     විෂය - චිත්‍ර   **අදාල සතිය :-** දෙසැම්බර් පළමු සතිය (තුන්වන වාරය)

**02 පාඩම හෝ ඒකකය -** 7.4.2 - ගුප්ත යුගයට අයත් කලා නිර්මාණ අගයමු.

**03. ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -**

- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණ නිරීක්ෂණය කරන්න.
- සරානාත් බුදු පිළිමයෙහි සුවිශේෂී ලක්ෂණ හදුනා ගන්න.
- සාරානාත් බුදු පිළිමය සම්බන්ධයෙන් වැඩි දුරටත් තොරතුරු එක් රැස් කරන්න
- පහත දී ඇති කියවීම් පත්‍රිකාව හා අනෙකුත් ඉගෙනුම් ආධාරක අධ්‍යයනය කර ඒ ඇසුරෙන් දී ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න
- පාසල ආරම්භ වූ පසුව ඔබේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න

**04. ඉහත ක්‍රියාකාරකම් සදහා උපකාර කර ගත හැකි පොත් පත් website හා ඉගෙනුම් ආධාරක**

- e තක්සලාව - www.e-thaksalawa.moe.gov.lk
- e නැණ පියස - course : 11 ශ්‍රේණිය චිත්‍ර කලාව :- http ://www.enenapiyasa.lk/lms/

**05. කියවීම් පත්‍රිකාව**



- ගුප්ත යුගයේ නිර්මාණය වූ මෙම බුදු පිළිමය සාරානාත් ප්‍රදේශයෙන් හමු වූවකි
- මෙමගින් බරණැස ඉසිපතන මිගදායේ දී බුදුන්වහන්සේ පස්වග තවුසන්ට කළ ප්‍රථම ධර්ම දේශනාව පවත්වන අවස්ථාව මින් නිරූපිත බව විචාරක මතයයි
- චූනාර් නම් ගල් විශේෂය භාවිතයෙන් නෙළා ඇත
- බුදුන් වහන්සේ වැඩ හිදින ආසනයේ,
    - මැද ධර්ම චක්‍රයක්
    - දෙපස මුවන් දෙදෙනෙක් හා අනෙකුත් මානව රූප සමූහයෙනුත් ඒ බව පැහැදිලි වේ
- පිළිමයේ හිසට පිටුපසින් අලංකාර ප්‍රභාමණ්ඩලයකි. එයට පහතින් පිළිමය දෙපස මකර හා අශ්ව රූප සම්බන්ධ අලංකාර කැටයමකි
- උෂ්ණීසය, අක්ඛඹරුවන් හිසකෙස්, අඩවන් දෙනෙත්, ලඹ සවන් හා මුහුණින් උපශාන්ත බව හා මහා කරුණාව සහිත මහා පෞරුෂ ලක්ෂණ ඉස්මතු වේ
- දෙවුර වසා ඇති චීවරය ශරීරයට ඇලුණු හා එහි සියුම් රේඛා කිහිපයකින් චීවරය ඉස්මතු කර ඇත
- සාරානාත් කෞතුකාගාරයේ මෙය ප්‍රදර්ශනයට තබා ඇත

**06. අතිරේක පොත්/ සඟරා**

11 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**07. මෙම සතිය තුළ නියමිත පාඩම් තුළින් ලබාගත යුතු ඉගෙනුම් ඵල**

- සාරානාත් බුදුපිළිමය හඳුනාගෙන නම් කරයි
- එහි ඓතිහාසික පසුබිම හඳුනාගෙන නම් කරයි
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම හඳුනාගෙන නම් කරයි
- සාරානාත් බුදුපිළිමයේ කලා ලක්ෂණ පිළිබඳ දැනුවත් වෙයි

**08. ඇගයීම/ තක්සේරු කරන ක්‍රමවේදය හා ආකෘති**

- ගුප්ත යුගයට අයත් කලා නිර්මාණ වල ඓතිහාසික පසුබිම, වස්තු විෂයන් හා එම නිර්මාණ නම් කරන්න,
- සාරානාත් බුදු පිළිමයේ නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්පක්‍රම නම් කරන්න